[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 08 ශ්‍රේණිය | විෂයය - භූගෝල විද්‍යාව | පත්‍රය I/II | පැය - 02 යි. |

නම ..........................................................................................................

I කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
**අංක 01 - 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01). පෘථිවියේ ජීවය පැවැත්මට අවශ්‍ය ශක්තිය ලබා දෙන ප්‍රධානතම මූලය වන්නේ ................................ය.

02). දේශාංශ 180° ඔස්සේ රටවල් කැපී නොයන පරිදි ........................... ලකුණු කර ඇත.

03). පෘථිවියේ ගුරුත්වාකර්ෂණ ශක්තිය මගින් වායුගෝලය ............................... හා බැඳී පවතී.

04). පොළෝතලයේ ඇති විවිධ ලක්ෂණ .................................. මගින් ඉදිරිපත් කළ හැකිය.

05). ඇමරිකාවේ ඇති තාරකා විද්‍යා ආයතනයකි ........................................

**(ජාත්‍යන්තර දින රේඛාව, සූර්යයා, සමකය, පෘථිවි තලය, කැල්ටෙක්, සිතියම්)**

**අංක 06 -10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

06). සූර්යයාට දුරින්ම පිහිටි ග්‍රහලෝකය නෙප්චූන් ය. ( )

07). සුළඟ යනු වායුගෝලයේ සිදුවන චලනයන් ය. ( )

08). ශ්‍රී ලංකා සිතියම සිතියම් පත්‍ර 29 ක ට බෙදා ඇත. ( )

09). භූ ලක්ෂණ දැක්වීමේදී සමෝච්ච රේඛා භාවිත කෙරේ. ( )

10). ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියමේ සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි. ( )

**ප්‍රශ්න අංක 11 -15 දක්වා ප්‍රශ්නවල "අ" කොටසෙහි දක්වා ඇති ප්‍රකාශයට ගැළපෙන පදය "ආ"කොටසින් තෝරා ඉරකින් යා කරන්න.**

| අ | ආ |
|---|---|
| 11). මාර්තු 21 සමකයට හිරු මුදුන් වීම. | සෙනසුරු |
| 12). සැප්තැම්බර් 23 දින සමකයට හිරු මුදුන් වීම. | ග්‍රහක නම්වේ |
| 13). දර්ශනීය වළලු පද්ධතියක් සහිත ග්‍රහ ලෝකයකි. | වසන්ත සූර්ය විෂුව |
| 14). පෘථිවිය තම අක්ෂය වටා කැරකීම | සරත් සූර්ය විෂුව |
| 15). සෞරග්‍රහ මණ්ඩලය නිර්මාණයේ දී ශේෂ වූ කැබලි | භ්‍රමණයයි |

**අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16). ක්‍රි.ව 1610 දී විශ්වය නිරීක්ෂණය සඳහා දුරදක්නය මුලින්ම භාවිතා කරන ලද්දේ,

1).අයිසෙක් නිව්ටන් ය. 2).ගැලිලියෝ ගැලිලි ය.
3).නිකලස්කොපර්නිකස් ය. 4).ජොහැන්නස් කෙප්ලර් ය.

17). සූර්යයාගේ මතුපිට සූර්ය කුණාටු ඇති වන විට සිදුවන ක්‍රියාවලිය මින් කුමක්ද?

1).තාපය ලබා දීම. 2).ගිනි දළු විහිදීම.
3).සුළඟක් ඇතිවීම. 4).අවට වායුව ගිනි ගැනීම.

18). සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතරින් අධිකව ගුරුත්වාකර්ෂණ බලය ඇති ග්‍රහලෝකය කුමක්ද?

1).අඟහරු 2).සිකුරු
3).සෙනසුරු 4).බ්‍රහස්පති

19). සෞරග්‍රහ මණ්ඩලයේ මතුපිට උෂ්ණත්වය අඩුම ග්‍රහලෝකය වන්නේ මින් කුමක්ද?

1).අඟහරු 2).බුධ
3).සෙනසුරු 4).සිකුරු

20). දේශාංශ පදනම් කරගනිමින් පෘථිවිය සම්මත කාල (වේලා) කලාප කීයකට බෙදා තිබේ ද?

1). 4යි. 2). 15 යි.
3). 24 යි. 4). 360 යි .

**(ලකුණු 2× 20 = 40)**

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

01).

I). පහත දැක්වෙන භූ ලක්ෂණ අතරින් භූමිය මත දැකිය හැකි ස්වභාවික ලක්ෂණ හා මිනිසාගේ මැදිහත් වීමෙන් නිර්මාණය කරන ලද ලක්ෂණ දෙක බැගින් වෙන් කර ලියන්න.

**කඳු වැටි,ගොඩනැගිලි,වනාන්තර,වගාබිම්,තණබිම්,වැව්,ගංගා ,මහා මාර්ග**

A.ස්වභාවික ලක්ෂණ -:

B.මිනිසාගේ මැදිහත්වීමෙන් නිර්මාණය කරන ලද -: (ලකුණු 04)

II). 1: 50000 භූ ලක්ෂණ සිතියම සකස් කරන ලද්දේ කුමන දෙපාර්තමේන්තුව මඟින් ද? (ලකුණු 02)

III). ශ්‍රී ලංකාවේ පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුවට දුර ප්‍රමාණය කිලෝමීටර වලින් දක්වන්න. (ලකුණු 02)

IV). 1:50000 භූ ලක්ෂණ සිතියම්වල පහත දැක්වෙන සම්මත සලකුණු වලින් දැක්වෙන දෑ නම් කරන්න.

A. + - - + - - + - -

B. • + • + • + • + • +

C. 

D. ✝ (ලකුණු 08)

02).

I). සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියා නම් කරන්න. (ලකුණු 02)

II). අභ්‍යන්තර ග්‍රහලෝක හතරක් නම් කරන්න. (ලකුණු 04)

III). ග්‍රහ වස්තූන් හා තරු එකිනෙකට වෙනස් වන්නේ කෙසේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03).

I). වාමන ග්‍රහයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II). පහත දැක්වෙන ග්‍රහ ලෝකයන් ලෝකයන් හි උපග්‍රහයන් සංඛ්‍යාව දක්වන්න.

A. පෘථිවිය -

B. අඟහරු - (ලකුණු 04)

III). සෞරග්‍රහ මණ්ඩලය හා බැඳී පවතින විශ්වාසයන් කිහිපයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04).

I). ලෝකයේ ප්‍රාදේශීය වශයෙන් සම්මත වේලාවල් භාවිතාවන විශාල රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

III). පෘථිවිය සෞරග්‍රහ මණ්ඩලය තුළ ඇති සුවිශේෂී ග්‍රහලෝකයක් ලෙස සැලකීමට හේතුවන කරුණු පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

05).

I). පෘථිවි පරිභ්‍රමණය යනු කුමක්දැයි දක්වන්න. (ලකුණු 02)

II). පෘථිවියේ ප්‍රධාන සෘතු හතර නම් කරන්න. (ලකුණු 04)

III). ඔබ ඉහතින් නම් කළ එක් සෘතුවක් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

06).

I). වායුගෝලයේ බහුලවම අඩංගු වායු වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). වායුගෝලය දූෂණය වීමට හේතු වන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III). වායුගෝලයේ ප්‍රයෝජන පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

07).

I). පෘථිවියේ ජලය පවතින ප්‍රධාන ආකාර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). පෘථිවිය මත ජලයේ ව්‍යාප්තිය සිදු වී ඇති ආකාර හතරක් දක්වන්න. (ලකුණු 04)

III). ජලයෙන් ලැබෙන ප්‍රයෝජන පහක් කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 05)

## 8 ශ්‍රේණිය පිළිතුරු
### I කොටස

1) සූර්යයා
2)ජාත්‍යන්තර දින රේඛාව
3) පෘථිවි තලය
4) සිතියම්
5) කැල්ටෙක්
6) ✓
7) ✓
8) ×හරි
9) ✓
10) වසන්ත සූර්ය විෂුවය
11) සරත් සූර්ය විෂුවය
12) සෙනසුරු
13) භ්‍රමණයයි
14) ග්‍රහක නම් වේ
15) ගැලිලියෝ ගැලිලි
16) ගිනි දළු විහිදීම
17) බ්‍රහස්පති
18) සිකුරු
19) 24 යි

### II කොටස

1).
I. A - කඳුවැටි,වනාන්තර,තෘණබිම්,ගංගා
B - ගොඩනැගිලි,වගාබිම්,වැව්,මහා මාර්ග
II. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
III. 432km
IV. A - පළාත
B - දිස්ත්‍රික්කය
C - ප්‍රධාන මාර්ගය (ඒ)
D – ක්‍රිස්තියානි පල්ලිය
2).
I. සූර්යයා
II. බුධ, සිකුරු, පෘථිවිය, අඟහරු
III. තාරකා ආලෝකය නිකුත් කරයි.
ග්‍රහ වස්තූන් ආලෝකය නිකුත් නොකර නමුත් සූර්යයාගෙන් ලැබෙන ආලෝකය පරාවර්තනය කරයි.ඒ නිසා බැබළීමක් නොමැතිව ඒකාකාරී ආලෝකයක් සහිත ව අහස දර්ශනය වේ.

3).
I. ප්ලූටෝ,එරිච්,සෙරිටි,මාකේටාකේ
II.
A- 1
B – 2
III.  හිරු හා සඳු දේවත්වය සේ සලකා වන්දනා කිරීම
හිරු හා සඳු ග්‍රහයන් පදනම් කරගෙන ජ්‍යොතිර් විද්‍යාව නිර්මාණය
ජන්ම පත්‍ර සැකසීම / හිරු සඳු පදනම් කරගත් විවිධ උත්සව, ගොවිතැන් කටයුතු
4).
I. ඇමරිකාව,කැනඩාව, ඕස්ට්‍රේලියාව, රුසියා
II. දිවා හා රාත්‍රිය ඇතිවීම/ වෙලාවේ ප්‍රාදේශීයවෙනස්කම්
III. ජීවීන්ට හිතකර වීම/ ජලය පැවතීම/මධ්‍යස්ථ උෂ්ණත්වය/ භ්‍රමණය හා පරිභ්‍රමණය සිදුවීම/ ගුරුත්වාකර්ෂණ බල බලය

5).
I. පෘථිවිය සූර්යයා වටා ගමන් කිරීම
II. ගිම්හාන/ සරත්/ සිසිර/ වසන්ත
III. අදාල විස්තරයට ලකුණු ලබා දෙන්න.

6).
I. නයිට්‍රජන්, ඔක්සිජන්,ආගන්
II. නිවැරදි පිළිතුරු සඳහා
III.වායුවජීවයේ පැවැත්මට/ වර්ෂණය ඇතිකිරීම/ උෂ්ණත්වය පාලනය වැනි

7).
I. ද්‍රව, ඝන, වායු
II. සාගර හා මුහුදු/ භූගත ජලය/ මිරිදිය ජලය
III. ගෘහස්ත කටයුතු සඳහා.
කෘෂිකාර්මික කටයුතු
විදුලි නළය බලය උත්පාදනය

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න




| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**